# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා තජිකිස්තාන් ජනරජය අතර ද්වි පාර්ශවික සබඳතා ශක්තිමත් කිරීමේ ඒකාබද්ධතා ප්‍රකාශය

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආරාධනයකට අනුව 2016 දෙසැම්බර් මස 12 දින සිට 14 දින දක්වා තෙදින නිල සංචාරයක් සඳහා ටජිකිස්තාන් ජනරජයේ අතිගරු ජනාධිපති එමොමලි රාමොන් මැතිතුමා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පැමිණියේය. එම නිල සංචාරය අතරතුර ටජිකිස්තාන් ජනාධිපති එමොමලි රාමොන් මැතිතුමා ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා කතානායක කරු ජයසූරිය මැතිතුමා සමඟ නිල සාකච්ඡා පවත්වන්නට යෙදිනි.

2. මෙම නිල සංචාරයට පෙරාතුව 2016 අගෝස්තු මස ඉන්දුනීසියාවේ ජාකර්තා නුවර පැවති 12 වෙනි ලෝක ඉස්ලාමීය ආර්ථික සමුළුවේදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ජනාධිපති එමොමලි රාමොන් මැතිතුමා හමුවී ඇත.

3. දෙරට අතර ද්විපාර්ශවික සාකච්ඡා ආරම්භයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අදහස් දක්වමින්, මෙම අවස්ථාව ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මණ්ඩලයට අයත් රටක නායකයෙක් නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම අවස්ථාව වන බැවින්, ජනපති එමොමාලි රාමොන් මැතිතුමාව පිළිගැනීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සළකන බව ප්‍රකාශ කර සිටියේය. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මණ්ඩලයට අයත් අනෙකුත් මිත්‍ර රාජ්‍යයන් සමඟ සමීප ද්විපාර්ශවික සබඳතා පැවැත්වීමට ශ්‍රී ලංකාවේ ඇති කැමැත්ත පළකර සිටියේය.

4. දේශපාලන, ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික අංශවල ද්විපාර්ශවික වැඩසටහන්වල ප්‍රගමනය උදෙසා ක්‍රියාකරන බවට දෙරට නායකයෝ මෙම නිල සාකච්ඡා අතරතුරදී නැවත වරක් ප්‍රකාශ කර සිටියහ. වෙළඳ හා ආයෝජන අංශවලත් අධ්‍යාපන හා සංචාරක අංශවලත් දියුණුව සඳහා දෙරට අතර සහයෝගය පුළුල් කිරීමට අවශ්‍ය පියවරවල් කෙරෙහි දෙරටේ නායකයන්ගේ අවධානය යොමු වූ අතර පහත ක්ෂේත්‍රයන් දියුණු කිරීම උදෙසා අවශ්‍ය ද්විපාර්ශවික සහයෝගීතාව ශක්තිමත් කිරීමට එකඟවිය.

<u>දේශපාලන සබඳතා</u>

5. මෙහිදී ශ්‍රී ලංකාව හා ටජිකිස්තානය අතර විවිධ පැතිකඩයන් ඔස්සේ ද්විපාර්ශවික සහයෝගීතාව, සංවර්ධනය හා ඉහළ නැංවීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරී මට්ටමේ පටන් ඉහළ මට්ටමේ අන්තර් සහයෝගීතාවක් පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳ දෙරට නායකයන්ගේ අවධානය යොමුවිය. මෙම පරමාර්ථය යතාර්ථයක් කරගැනීමේ අරමුණින් හා දෙරට

අතර ව්‍යුහගත ක්‍රමවත් අන්තර් සම්බන්ධතාවක් ඇති කිරීමේ අරමුණින් මේ සඳහා වූ විධිමත් ද්වි පාර්ශවික නෛතික රාමුවක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය හා ටජිකිස්තාන් ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර දේශපාලන උපදෙස් හුවමාරු කරගැනීමට අදාළ අවබෝධාත්මක ගිවිසුමකට අත්සන් තබන ලදී.

6. දෙරට අතර අන්තර් පාර්ලිමේන්තු සහයෝගීතාව ඇති කිරීමේ වැදගත්කම අවබෝධ කර ගනිමින් ශ්‍රී ලංකාවේ හා ටජිකිස්තානයේ ජාතික පාර්ලිමේන්තු තුළ පාර්ලිමේන්තු හිත මිතුරු කණ්ඩායම් ඇති කිරීමේ අවශ්‍යතාව දෙරටේ නියෝජිතයන් මෙහිදී ඉස්මතු කර දක්වන ලදී.

7. දෙරට අතර ද්විපාර්ශවික වැඩසටහන් ශක්තිමත් කිරීම හා සංවර්ධනය කෙරෙහි තානාපති සේවයේ වැදගත්කම සළකමින් ජනපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා ජනපති රාමොන් මැතිතුමා ශ්‍රී ලංකාවට ටජිකිස්තානු පූර්ණ බල සහිත තානාපතිවරයෙක් හා ටජිකිස්තානයට ශ්‍රී ලාංකික පූර්ණ බල සහිත තානාපතිවරයෙක් පත් කිරීම පිළිගන්නා ලදී.

<u>ආර්ථික, වෙළඳ හා ආයෝජන සහයෝගීතාව</u>

8. දෙරට අතර බැංකුකරණය හා මූල්‍ය, ජල ශක්තිය හා පුනර්ජනනීය බලශක්තිය, කර්මාන්ත, කෘෂිකර්මාන්තය හා ආහාර නිෂ්පාදනය, සෞඛ්‍යය, තොරතුරු තාක්ෂණය, ප්‍රවාහන ක්‍රම හා සංචාරක කර්මාන්තය ආදී සුවිශේෂී ක්ෂේත්‍රවල නව ආයෝජන අවස්ථා හා ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීම සඳහා දෙරට නායකයන් මෙහිදී එකඟ වූහ. මෙම සාකච්ඡාවලදී, ව්‍යාපාර, වෙළඳ හා තාක්ෂණ සහයෝගීතාව පුළුල් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල මට්ටමින් ඒකාබද්ධ ආර්ථික කොමිසමක් පිහිටුවීමේ වැදගත්කම දෙරටෙහි නායකයන්ගේ අවධානයට ලක්විය.

9. දෙරට අතර වාණිජ සහයෝගීතාව ඇති කිරීම කෙරෙහි උනන්දු වෙමින් දෙරටෙහි ජනාධිපතිවරු යෝජිත ටජික් - ශ්‍රී ලංකා ව්‍යාපාර කවුන්සිලය පිහිටුවීම පිළිබඳවත් ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය හා ටජිකිස්තාන් ජනරජයේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය අතර අත්සන් කිරීමට නියමිත අවබෝධතා ගිවිසුම පිළිබඳවත් සිය එකඟතාව පළ කරන ලදී. දෙරට අතර වෙළඳ කටයුතු ප්‍රචාරණය හා දෙරටෙහි ආර්ථික සමුළු හා වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම තුළින් පුද්ගලික අංශයේ ව්‍යාපාර සම්බන්ධතා දියුණු කිරීම සඳහා අනුබල දීමට මෙහිදී දෙරට නායකයන් වැඩිදුරටත් තීරණය කරන ලදී. තම රටවල විශේෂ ආර්ථික කලාප හා කාර්මික උද්‍යාන තුළ පවා ශ්‍රී ලාංකීය හා ටජිකිස්තානු ආයෝජකයන් හා ව්‍යවසායකයන් සඳහා ව්‍යාපාරික අවස්ථා ඇති කිරීමට සුදුසු පරිසරයක් හා හිතකාමී නෛතික රාමුවක් තම රට තුළ නිර්මාණය කිරීමට තමා තුළ පවතින කැමැත්ත පිළිබඳවද මෙහිදී දෙරටේ නායකයන් අදහස් දක්වන ලදී.

10. මේ අනුව, අන්‍යෝන්‍ය සහයෝගීතාව පිළිබඳ ගිවිසුමක් කෙටුම්පත් කිරීමෙහිලා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා ටජිකිස්තානු ජනරජයේ ආර්ථික සංවර්ධනය හා වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය අතර උපදේශක මණ්ඩලයක් ඇති කිරීමට දෙරට නායකයන් කැමැත්ත පළ කරන ලදී.

<u>සංස්කෘතිය, අධ්‍යාපනය, සංචාරක ව්‍යාපාරය, ක්‍රීඩා හා පුද්ගල සම්බන්ධතා යන ක්ෂේත්‍රවල සහයෝගීතාව</u>

11. දෙරටෙහි පවතින වටිනාකම් හා සංස්කෘතික බැඳියාව පිළිබඳ අදහස් දෙපක්ෂය හුවමාරු කරගන්නා ලද අතර, සංස්කෘතිය, අධ්‍යාපනය, සංචාරක ව්‍යාපාරය, ක්‍රීඩා හා පුද්ගල සම්බන්ධතා යන ක්ෂේත්‍රවල සහයෝගීතාව පුළුල් කිරීම හා උසස් කිරීමට අදාළ යෝජනා පිළිබඳ සාකච්ඡා කරන ලදී.

12. මේ යටතේ දෙරටෙහි නායකයන් ශ්‍රී ලංකාව හා තජිකිස්තානය අතර පහත දැක්වෙන එකඟතා හා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට එකඟතාව පළ කරන ලදී.
    - ටජිකිස්තාන් ජනරජය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජය අතර ශාරීරික ව්‍යායාම හා ක්‍රීඩා ක්ෂේත්‍රවල සහයෝගීතාව පිළිබඳ ගිවිසුම.
    - සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳ ටජිකිස්තාන් ජනරජය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජය අතර අවබෝධතා ගිවිසුම.

13. දෙරටෙහි අධ්‍යාපන අංශවල වැදගත්කම හඳුනාගනිමින්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා ජනාධිපති රාමොන් මැතිතුමා පීඨ සාමාජිකයින් හා සිසුන් දෙරට අතර හුවමාරු කරගැනීම තුළින් හා සමාන ක්ෂේත්‍රයන්හිදී පර්යේෂණ සඳහා හවුල්වීම තුළින් උසස් අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුවට අදාළව දෙරට අතර සහයෝගීතාව ඉහළ නැංවීමට ඉවහල් වන යෝජනා සඳහා තම එකඟතාව පළකරන ලදී.

14. ශ්‍රී ලංකාවේ සිටින ආධුනික ටජිකිස්තානු රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා රාජ්‍ය තාන්ත්‍රික හා සිංහල භාෂා පුහුණුව ලබාදීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමටත් දෙරටෙහි නායකයන් සාකච්ඡා කරන ලදී.

<u>ආරක්ෂාව පිළිබඳ සහයෝගීතාව සහ කලාපීය හා ජාත්‍යන්තර විෂයයන්ට අදාළ සහයෝගීතාව</u>

15. ත්‍රස්තවාදය, අන්තවාදීන්, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ අනෙකුත් සංවිධානාත්මක අපරාධ හරහා ජාතික, කලාපීය හා අන්තර්ජාතික ආරක්ෂාවට එල්ල වී ඇති තර්ජන හඳුනාගත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා ජනාධිපති එමොමලි රාමොන් මැතිතුමා

දෙරටෙහි අදාළ කාර්යාංශ අතර කාර්ය කණ්ඩායම් ඇති කරමින් ද්විපාර්ශවික ආරක්ෂක සහයෝගීතාව ශක්තිමත් කිරීමට එකඟ වූහ.

16. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය තුළදීත් ෂැංහයි සහයෝගීතා සංවිධානය තුළදීත් හා අනෙකුත් කලාපීය හා අන්තර්ජාතික කටයුතුවලදීත් දෙරට අතර දැනට පවතින සහයෝගීතාව දෙරටේ ජනපතිවරුන්ගේ ඇගයුමට ලක්විය. එම සහයෝගීතාව එක්සත් ජාතීන්ගේ සංගමය තුළ තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2030 වසර සඳහා වන තිරසාර සංවර්ධන වැඩසටහනේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමටත් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ අපේක්ෂකත්වය ලබා ගැනීම හා ජාත්‍යන්තර සංවිධානවල අපේක්ෂකත්වය ලබාගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමටත් දෙරටෙහි නායකයන් මෙහිදී එකඟතාව පළකරන ලදී.

17. ජලය හා සම්බන්ධ තිරසාර සංවර්ධන ඉලක්ක වැඩිදියුණු කිරීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ජනාධිපති එමොමලි රාමොන් මැතිතුමා විසින් ගෙන එන ලද තිරසාර සංවර්ධනය හා ජලය යන ආදර්ශ පාඨය යටතේ නව ජාත්‍යන්තර දශකය තුළ ක්‍රියාත්මක වීම යන සංකල්පයට සිය එකඟතාව පළකළ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට කැමැත්ත පළ කර සිටින ලදී.

<u>සමාප්ත සටහන්</u>

18. මෙම නිල සංචාරය තුළ තමාටත් තම කණ්ඩායමටත් දක්වන ලද උණුසුම් පිළිගැනීම පිළිබඳව හා දක්වන ලද ආගන්තුක සත්කාර පිළිබඳ සිය කෘතඥතාව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙතත්, අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙතත් හා ශ්‍රී ලාංකීය ජනතාව වෙතත් පළකර සිටින බව මෙහිදී ජනාධිපති එමොමලි රාමොන් මැතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

19. ටජිකිස්තානු ජනාධිපති තජිකිස්තානයේ නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකා ජනාධිපතිවරයාට ආරාධනා කර සිටීමට මෙය අවස්ථාවක් කරගන්නා ලදී.

20. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එම ආරාධනාව පිළිබඳ සිය ස්තූතිය පළ කරමින් ලබන වසර මුල තමන් ටජිකිස්ථාන් ජනරජයේ නිල සංචාරයකට සහභාගීවීමට බලාපොරොත්තු වන බව දන්වා සිටින ලදී.

2016 දෙසැම්බර් 14

කොළඹදී.